**2025-05-07 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල
රැස්වීමේදී එළඹුණු තීරණ**

**01. රජයේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය - 2025 පළමුවන කාර්තුව**

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 53(1) වගන්තිය අනුව, අවම වශයෙන් කාර්තුමය පදනමක් මත මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් රජයේ ආදායම් සහ වියදම් ඇතුළු මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයක් කාර්තුව අවසන් වී දින 45කට නොඅඩු කාලයක් තුළදී අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. එම විධිවිධාන පරිදි 2025-03-31 දිනෙන් අවසන් වන 2025 වර්ෂයේ පළමුවන කාර්තුව සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 2025-05-15 දිනා හෝ ඊට පෙර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු වේ. ඒ අනුව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ 2025 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල දක්වා ඇති වර්ගීකරණයන් මත පදනම්ව 2025-01-01 දින සිට 2025-03-31 දින දක්වා වන 2025 වර්ෂයේ පළමුවන කාර්තුවට අදාළ සියලුම විශේෂ වියදම් ඒකක, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් වාර්තා කරන ලද පහත සඳහන් සමුච්චිත ආදායම් සහ වියදම් ඇතුළත් කරමින් සකස් කරනු ලැබ ඇති මූල්‍ය කාර්යසාධනය පිළිබඳ වාර්තාව අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගන්නා ලදී.

| | ආදායම | රුපියල් බිලියන |
|---|---|---|
| 01. | බදු ආදායම | 970.58 |
| 02. | බදු නොවන ආදායම | 87.26 |
| 03. | ප්‍රාග්ධන ආදායම | 5.77 |
| 04. | ප්‍රදාන | 1.05 |
| | **මුළු ආදායම** | **1,064.66** |

| | වියදම | රුපියල් බිලියන |
|---|---|---|
| 01. | පුනරාවර්තන වියදම | 1,226.55 |
| 02. | ප්‍රාග්ධන වියදම (රාජ්‍ය ණය ආපසු ගෙවීම් ඇතුළුව) | 336.39 |
| | **මුළු වියදම** | **1,562.94** |



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05. இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

02. **රජයේ අභිචෝදක කාර්යාලය පිහිටුවීම**

අධිකරණ පද්ධතිය තුළ සිදුවන ප්‍රමාදයන් වැළැක්වීමේ යාන්ත්‍රණයක් ලෙස රජයේ අභිචෝදක කාර්යාලයක් හඳුන්වා දීමටත්, රජය වෙනුවෙන් නඩු කටයුතු මෙහෙයවීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවෙන් පරිබාහිරව ස්වාධීනව ක්‍රියාත්මක වන රජයේ අභිචෝදක කාර්යාලයක් පිහිටුවීම සහ පළාත්බද ව උප කාර්යාල පිහිටුවීමටත් වත්මන් රජයේ මැතිවරණ ප්‍රකාශනය මඟින් යෝජනා කර ඇත. අපරාධ යුක්ති ක්‍රමයේ ස්වාධීනත්වය හා විනිවිදභාවය වැඩිදියුණු කිරීම සහ ජනතාවගේ විශ්වාසය දිනාගත හැකිවන පරිදි අපරාධ යුක්ති ක්‍රියාදාමය කඩිනම් කිරීම එමඟින් අපේක්ෂා කෙරේ. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරිය විසින් 2024 සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකාව පිළිබඳ ඉදිරිපත් කරන ලද අවසන් වාර්තාව මඟින් ද හදිසි අවශ්‍යතාවක් ලෙස සලකා ස්වාධීන අභිචෝදක අධිකාරියක් ස්ථාපිත කිරීම යෝජනා කර තිබේ. ඒ අනුව, එවැනි කාර්යාලයක් ස්ථාපිත කිරීම සඳහා නව නීතියක් හඳුන්වාදීම පිළිබඳව අධ්‍යයනය කර වාර්තා කිරීමටත්, අවශ්‍ය අවස්ථාවන්හිදී දැනට බලපවත්නා නීති සඳහා අවශ්‍ය සංශෝධන හඳුන්වා දීම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීමටත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු, ජනාධිපති නීතිඥ යසන්ත කෝදාගොඩ මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුතු තාක්ෂණික විශේෂඥ කමිටුවක් පත් කිරීම සඳහා අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් (SLINTEC) සහ ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් (SLIBREC) යන ආයතනවල කාර්යභාරය සමාලෝචනය කිරීම**

නැනෝ තාක්ෂණය පදනම් කර ගත් පර්යේෂණ සහ තාක්ෂණ හුවමාරුව සඳහා ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් ස්ථාපිත කර ඇත. එසේම, ජෛව තාක්ෂණ ආශ්‍රිත පර්යේෂණ තුළින් ජෛව තාක්ෂණ අපනයන වර්ධනය කිරීම හා ආනයන ආදේශක නිෂ්පාදන වර්ධනයක් ඇති කිරීම මූලික අරමුණ කොටගෙන ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් ස්ථාපිත කර තිබේ. වත්මන් දේශීය හා ලෝක ආර්ථික හා දේශපාලන ප්‍රවණතා යටතේ නැනෝ තාක්ෂණික හා ජෛව තාක්ෂණික පර්යේෂණ හා සංවර්ධන ප්‍රවේශයක් තුළින් ශ්‍රී ලංකාවේ සීඝ්‍ර ආර්ථික වර්ධනයක් සඳහා වැඩි දායකත්වයක් ලබා දීමට හැකි වන පරිදි එම ආයතන දෙක ප්‍රතිව්‍යුහගත කිරීම සුදුසු බවට හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් යන ආයතනවල කාර්යභාරය සමාලෝචනය කර, ඒවායේ නෛතික ව්‍යුහය හා උපායමාර්ගික සැලසුම් සඳහා සිදු කළ යුතු

ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් නිර්දේශ සහිත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස විද්වත් කමිටුවක් පත් කිරීම සඳහා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**04. ලයිපොසොමාල් වර්ගයේ ඇම්පොටෙරිසින් බී වයල් මිලිග්‍රෑම් 50න් වයල් 30,000ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය**

ක්‍රිප්ටොකොකල් මෙනින්ජයිටිස් සහ අන්තරංග ලිෂ්මේනියාසස් ඇතුළු ජීවිත අවදානමක් ඇති කරන දිලීර ආසාදනවලට ප්‍රතිකාර කිරීමේදී විශේෂයෙන්ම අවදානම් සහගත ප්‍රතිශක්තිකරණ පද්ධති ඇති පුද්ගලයින් සඳහා භාවිත කරනු ලබන ලයිපොසොමාල් වර්ගයේ ඇම්පොටෙරිසින් බී වයල් මිලිග්‍රෑම් 50න් වයල් 30,000ක් මිල දී ගැනීම සඳහා ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු තුනක් ලැබී තිබේ. ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව, සාරානුකූලව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වූ ශ්‍රී ලංකාවෙහි M/s. Slim Pharmaceuticals (Pvt) Ltd., (Manufacturer - M/s. Gufic Bioscience Ltd., India) වෙත, අදාළ ප්‍රසම්පාදනය මුළු පිරිවැය ශ්‍රී ලංකා රුපියල් මිලියන 194.26ක මුදලකට පිරිනැමීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**05. සම්පූර්ණ දණහිස් ප්‍රතිස්ථාපන (TKR) පද්ධතිය සඳහා ශරීරයට බද්ධ කරන TKR සංරචක කට්ටල 3,000ක් සැපයීම සඳහා වූ ප්‍රසම්පාදනය**

දැඩි ලෙස හානි වූ හෝ ගෙවී ගිය දණහිස් සන්ධියක් ප්‍රතිස්ථාපනය කිරීමෙන් සංචලතාව වැඩිදියුණු කිරීමට භාවිත කරනු ලබන, රෝගියාට අනුව ඉහළ නම්‍යතාවකින් යුතු දණහිස් වර්ගයේ සම්පූර්ණ දණහිස් ප්‍රතිස්ථාපන පද්ධතිය සඳහා ශරීරයට බද්ධ කරන TKR සංරචක කට්ටල 3,000ක් සපයා ගැනීම සඳහා ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවා ඇත. ඒ සඳහා එක් ලංසුවක් පමණක් ඉදිරිපත් වී තිබේ. ඉදිරිපත් කර තිබූ මිල ගණන් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමෙන් අනතුරුව, ලංසු මිලෙන් 2%ක වට්ටමක් ලබා දීමට ලංසුකරු වන M/s Zimmer Pte Ltd (Manufacturer : Zimmer Inc., USA)හි දේශීය නියෝජිතායතනය වන M/s Zodiac Medicals (Pvt) Ltd. එකඟතාව පළ කර තිබේ. TKR සංරචක කට්ටල 3,000ක් වෙනුවට හදිසි අවශ්‍යතාවන් සඳහා දැනට TKR සංරචක කට්ටල 1,000ක් පමණක් සපයා ගැනීම පිණිස සිංගප්පූරුවේ M/s Zimmer Pte Ltd (Manufacturer : Zimmer Inc., USA) වෙත ප්‍රසම්පාදනය පිරිනැමීමටත්, ඉතිරි ප්‍රමාණය සපයා ගැනීම සඳහා සීමිත ජාත්‍යන්තර තරගකාරී ලංසු ක්‍රමවේදය අනුගමනය කරමින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් නැවත ලංසු කැඳවීමටත් ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කර තිබේ. ඒ අනුව, එකී නිර්දේශය ක්‍රියාත්මක

කිරීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**06. ලෝක බැංකුවේ සහ ආසියානු සංවර්ධන බැංකුවේ පූර්ණ අන්‍යෝන්‍ය විශ්වාසය පිළිබඳ කාර්යරාමුව යටතේ ඉහළ ප්‍රමුඛතා සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම**

ලංකා විදුලිබල මණ්ඩලය විසින් සකස් කරන ලද 2023-2032 දිගුකාලීන සම්ප්‍රේෂණ සැලැස්ම යටතේ හඳුනාගනු ලැබ ඇති ඉහළ ප්‍රමුඛතා සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති මාලාවක් ක්‍රියාවට නැංවීම සඳහා පූර්ණ අන්‍යෝන්‍ය විශ්වාසය පිළිබඳ කාර්යරාමුව යටතේ මූල්‍ය සහාය ලබා දීමට ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව සිය කැමැත්ත පළ කර ඇත. යෝජිත පූර්ණ අන්‍යෝන්‍ය විශ්වාසය පිළිබඳ කාර්යරාමුව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති 10ක් හඳුනාගනු ලැබ තිබේ. ජාත්‍යන්තර සංවර්ධන සමාගමය විසින් ලබා දීමට නියමිත ඇමෙරිකානු ඩොලර් මිලියන 10ක ඇපකර පහසුකමක් ද සහිතව ලෝක බැංකුව ඇමෙරිකානු ඩොලර් මිලියන 40ක් ද ආසියානු සංවර්ධන බැංකුව විසින් ඇමෙරිකානු ඩොලර් මිලියන 30ක් ද මේ යටතේ ආයෝජනය කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් එක්ව පිරිනමනු ලබන පූර්ණ අන්‍යෝන්‍ය විශ්වාසය පිළිබඳ කාර්යරාමුව යටතේ යෝජිත ග්‍රිඩ් උපපොළ සංවර්ධනය කිරීම පිණිස ඇමෙරිකානු ඩොලර් මිලියන 60ක ආයෝජන පැකේජය ලබා ගැනීමට සහ ඇමෙරිකානු ඩොලර් මිලියන 10ක් වූ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය විසින් අනුග්‍රහය ලබා දෙන අවදානමෙන් සුරක්ෂිත කිරීමේ ඇපකර පහසුකම ලබා ගැනීමට අදාළව ඉදිරි පියවර ගැනීම පිණිස බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**07. මන්නාරම් ද්‍රෝණියේ ගවේෂණ බිම් කොටස් හතරක ඛනිජතෙල් හා ස්වාභාවික වායු ගවේෂණය සහ නිෂ්පාදනය සඳහා ආයෝජන යෝජනා කැඳවීම සහ අලෙවිකරණ උපදේශකයෙකුගේ සේවය ලබා ගැනීම**

2011 වසරේදී කෙයාර්න් ලංකා (පුද්ගලික) සමාගම විසින් සිදු කරන ලද ගවේෂණ හා කැණීම්වලට අනුව, මන්නාරම් ද්‍රෝණියේ M2 ගවේෂණ බිම් කොටසින් ස්වාභාවික වායු නිධි 02ක් සොයා ගෙන ඇති අතර, එමඟින් මන්නාරම් ද්‍රෝණිය තුළ ශක්‍ය හයිඩ්‍රොකාබන් පද්ධතියක් පවතින බව සනාථ වී තිබේ. 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ විධිවිධාන අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද සහ රෙගුලාසි මඟින් නියම කර ඇති කාර්ය පටිපාටියට අනුකූලව අක්වෙරළ ඛනිජතෙල් හා ස්වාභාවික වායු ගවේෂණ බිම් කොටස් සඳහා ආයෝජන

යෝජනා කැඳවීමට ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය වෙත බලය පැවරී ඇත. ඒ අනුව, මන්නාරම ද්‍රෝණියේ ගවේෂණ බිම් කොටස් 04හි ඛනිජතෙල් හා ස්වාභාවික වායු ගවේෂණය සහ නිෂ්පාදනය සඳහා ආයෝජන යෝජනා කැඳවීම සඳහා බලපත්‍ර වටයක් ක්‍රියාත්මක කිරීමටත්, එම කාර්යය සඳහා ඵලදායී අලෙවිකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම පිණිස සුදුසු අලෙවිකරණ උපදේශකයෙකුගේ සේවය ලබා ගැනීමටත් බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 08. විනිමය පත්‍ර ආඥාපනත සඳහා සංශෝධන

(82 වන අධිකාරය වූ) 1927 අංක 25 දරන විනිමය පත්‍ර ආඥාපනතේ යල් පැන ගිය විධිවිධාන සංශෝධනය කිරීම හෝ ඉවත් කිරීම සඳහා 2024-01-24 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරන ලද විනිමය පත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් 2024-07-15 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. එහෙත්, 2024-09-24 දින පාර්ලිමේන්තුව විසුරුවා හැරීම හේතුවෙන් එකී පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. එබැවින්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා සහ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව සැලකිල්ලට ගෙන, විනිමය පත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත සඳහා අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දීමටත්, එකී පනත් කෙටුම්පත නැවත රජයේ ගැසට් පත්‍රයේ පළ කර ඉන් අනතුරුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පිණිස අනුමැතිය ලබා දීමටත් අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

## 09. 1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත සංශෝධනය කිරීම

1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා 2023-08-07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. නීති කෙටුම්පත් සම්පාදක විසින් එකී පනත් කෙටුම්පත සකස් කිරීමේ කටයුතු නිම කිරීම පිණිස වත්මන් අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා ගත යුතු බව පෙන්වා දී ඇත. ඒ අනුව, 1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතේ කාර්යයන් ඉදිරියට කරගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දීම පිණිස කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**10. ශ්‍රී ලංකා ආහාර විද්‍යා සහ තාක්ෂණ ආයතනය පිහිටුවීම සඳහා වන පාර්ලිමේන්තු පනත**

ආහාර තාක්ෂණයේ ශෙදන්නන් සහ විද්‍යාඥයින්ගෙන් සමන්විත, ස්වේච්ඡාවෙන් පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා ආහාර විද්‍යා සහ තාක්ෂණ ආයතනය 2004 වර්ෂයේදී පිහිටුවා ඇති අතර, එම ආයතනය මේ වන විට ඇපයෙන් සීමිත සමාගමක් වශයෙන් ලියාපදිංචි කර තිබේ. එම ආයතනය ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් පවත්වා ගැනීමට ලැබෙන රාජ්‍ය අනුග්‍රහයක් ලෙස සහ ආයතනයේ ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම සඳහා පාර්ලිමේන්තු පනතකින් නීතිගත කිරීම සඳහා 2016-09-27 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් නීතිපති විසින් ඉදිරිපත් කර ඇති සංශෝධන ඇතුළත් කරමින් අවසන් පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා 2024-06-11 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. එහෙත්, එම පනත් කෙටුම්පත මේ දක්වා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොමැත. එම කරුණු සැලකිල්ලට ගනිමින්, එකී පනත් කෙටුම්පත සකස් කිරීමේ කාර්යය කඩිනමින් නිම කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දීම පිණිස කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**11. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති රජයේ විගණනයට යටත් කිරීම**

සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති රජයේ විගණනයට යටත් කිරීම පිණිස සංශෝධනයක් ඇතුළත් කිරීම සඳහා 2017 අංක 2 දරන දිවි නැගුම (සංශෝධන) පනතින් සංශෝධිත 2013 අංක 1 දරන සමෘද්ධි පනත සංශෝධනය කිරීම පිණිස 2024-12-30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිශ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 12. විභාග කොමසාරිස් ජනරාල් තනතුරට පත් කිරීම

විභාග කොමසාරිස් ජනරාල් තනතුරෙහි සේවය කරන ලද එච්.ජේ.එම්.සී.ඒ.ජයසුන්දර මහතාගේ සේවා කාලය 2025-05-06 දිනෙන් අවසන් වී ඇත. ඒ අනුව පුරප්පාඩු වී ඇති විභාග කොමසාරිස් ජනරාල් තනතුර සඳහා දැනට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් තනතුරක සේවය කරනු ලබන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිනි ඒ.කේ.සුභාෂිණී ඉන්දිකා කුමාරි ලියනාගේ මහත්මිය වහාම ක්‍රියාත්මක වන පරිදි පත් කිරීම පිණිස අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

## 13. සර්වේයර් ජනරාල් තනතුර සඳහා පත් කිරීම

සර්වේයර් ජනරාල් ලෙස සේවය කළ ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී යූ.කේ.එස්.පී.විජේසිංහ මහතා වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත 2025-01-22 දින සිට රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබා ඇත. ඒ අනුව, පුරප්පාඩු වී ඇති සර්වේයර් ජනරාල් තනතුරට ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී වයි.ජී.ඥානතිලක මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි පත් කිරීම පිණිස කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 14. 2005 අංක 36 හා 2016 අංක 4 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත් සහ 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත සංශෝධනය කිරීම

රාජ්‍ය සේවකයින්ගේ වැටුප් ඉහළ නැංවීමට සමගාමීව පෞද්ගලික අංශයේ සේවකයින්ගේ ජාතික අවම මාසික හා දෛනික වේතනය ඉහළ නැංවීමට අදාළව 2005 අංක 36 දරන සේවකයින්ගේ අයවැය සහන දීමනාව පනත, 2016 අංක 4 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත සහ 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත සංශෝධනය කිරීම සඳහා 2025-04-07 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, එම පනත් සංශෝධනය කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක විසින් සංශෝධන පනත් කෙටුම්පත් සකස් කර ඇති අතර, ඒ සඳහා නීතිපතිගේ නිෂ්කාශනයත් ලැබී තිබේ. එකී සංශෝධන පනත් කෙටුම්පත් රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් කම්කරු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

*************